# ව්‍යවස්ථා සංශෝධනය

ඉදිරි මාස කිහිපයෙහි ආණ්ඩුවේ ප්‍රධාන ම කාර්යය වනුයේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම බව පැහැදිලි ය. මේ ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු ය. ඒ ගැන විවාදයක් නැත. එහෙත් ප්‍රශ්නය වනුයේ එය සංශෝධනය කරන්නේ කෙසේ ද යන්න ය. එමෙන් ම එහි දී අනුගමනය කරන ක්‍රියාමාර්ගය කුමක් ද යන්න ද ප්‍රශ්නයක් වනු ඇත.මෙහි දී බොර දියේ මාළු බෑමට ඉදිරිපත්වන්නෝ ද වෙති. ජාතික යැයි කියාගන්නා රූපවාහිනිය මේ දිනවල විවිධ අය සමග ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සාකච්ඡා පවත්වයි. මේ රූපවාහිනිය මා සමග ද සාකච්ඡාවක් කෙළේ ය. එහෙත් මා එහි දී කී දේ ඒ සැටියෙන් ම වාර්තාකිරීමට එහි ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරු අසමත්වූහ. මේ සාකච්ඡාවලට එන වැඩි පිරිසක් සන්ධානයට ඡන්දය දුන් අයගේ මතය නියෝජනය නොකරන බව ඉතා පහසුවෙන් කිවහැකි ය. ඔවුහු කසිකබල් වාමාංශික පක්ෂවල සාමාජිකයෝ වෙති. නැතහොත් අනුගාමිකයෝ වෙති. අඩුම තරමින් හිතවත්තු වෙති.

සන්ධානයේ මනාප ලබාගත්තේ කවුදැයි සොයා බැලීමේ දී පැහැදිලිවන කරුණ නම් සාමාන්‍යයෙන් වැඩියෙන් මනාප ලබාගෙන ඇත්තේ ජාතිකත්වය, ඒකීය රට වෙනුවෙන් පෙනී සිටි අපේක්ෂකයන් බව ය. සමසමාජ කොමද්‍යුනිස්ට් වැනි අභාවයට ගොස් ඇති පක්ෂවලින් ඉදිරිපත්වූවනට මනාප ලැබී නැත. බද්දේගම සමිත හිමිට මෙවර පාර්ලිමේන්තු අසුනක් අහිමි වූයේ උන්වහන්සේ මත ජනතාවගේ ආකර්ෂණයට ලක් නොවූ බැවින් ය. උන්වහන්සේ ෆෙඩරල් රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටියහ. මහජන පක්ෂයේ දැනට ටික කලකට පෙර සිටි අයට පවා මනාප නො ලැබුණි. විජය කුමාරතුංග මහතා විසින් පිහිටුවනු ලැබූ මහජන පක්ෂය ඒ මහතා මෙන් ම සිංහල විරෝධී විය. ඒ බව සිංහල බෞද්ධ ඡන්දදායකයා ඉවෙන් මෙන් දනියි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය යම් අයුරකින් ගම්පහ දිස්ත්‍රික්කය තරග කෙළෙහි නම් ඇයට අනුර බණ්ඩාරණායක මහතාට අඩුවෙන් මනාප ලැබෙන්නට තිබුණි. පොදු පෙරමුණ 1994 දී ජයග්‍රහණය කෙළේ යම් ප්‍රමාණයකට හෝ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය නිසා ය. ඇය එදා (විජාතික බලවේගවල ආධාරයෙන්) පොදු පෙරමුණට ආකර්ෂණීය නායකත්වයක් සැපයී ය. 2004 දී සංධානය ජයග්‍රහණය කෙළේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ නායකත්වයක් නිසා නොවන බව අවධාරණය කළ යුතු ය. 2004 ජයග්‍රහණය සිංහල බෞද්ධ බලවේගවල ජයක් විය. එය ශ්‍රී ල නි පක්ෂයේ, ජ වි පෙරමුණේ, ම ඒ පෙරමුණේ සාමාජිකයන්, අනුගාමිකයන් හා හිතවතුන් වූ පණස්හයේ දරුවන්ගේ ජයග්‍රහණයක් විය. චන්ද්‍රිකා කුමාරතුංග යනු කවුදැයි 1994 දී සිංහල බෞද්ධයන් නොදැන සිටි නමුදු අද ඇය ගැන ඔවුන්ගෙන් බොහෝ දෙනා දනිති. ඇයට තුන්වැනි වතාවකට ජනාධිපතිධුරය සඳහා තරග කළ නොහැකි ය. එසේ තරගකිරීමට හැකියාව තිබුණ ද අද ඇය ප්‍රබල අපේක්ෂිකාවක් නො වන්නී ය.

සන්ධානයට දුන් ඡන්දය සමස්තයක් ලෙස ගතහොත් ෆෙඩරල් රාජ්‍යයකට විරුද්ධව දුන් ඡන්දයක් වුව ද චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට අවශ්‍ය වී ඇත්තේ එය ෆෙඩරල් ක්‍රමය අනුමතකරන ඡන්දයක් බවට පත්කිරීම ය. ඒ බව අප කලින් නොදැන සිටියා නො වෙයි. ඇය තවමත් මහජන පක්ෂයේ මිස ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති අනුගමනය නො කරයි. සන්ධානයට ඡන්දය දුන් බහුතරයකගේ අපේක්ෂාවන්ට විරුද්ධව යෑමට ඇය සූදානම් වන්නී ය. අද සන්ධානයට ඡන්දය දුන් බහුතර ජනතාව ඇගේ අපේක්ෂාව පරාජය කිරීමට සූදානම් විය යුතු ය.

ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පත්කර ඇති නීතිඥයන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ආදීන්ගෙන් සමන්විත ඊනියා උපදේශක මණ්ඩලයේ අදහස් අපි දනිමු. ඔවුහු ෆෙඩරල් ගැත්තෝ වෙති. කලකට පෙර පැකේජය උස්සාගෙන ගියෝ ද මොවුහු ම වෙති. මොවුන්ට ඇත්තේ සහතික සුදුසුකම් ය. ඒ සහතික ඔවුන් ලබාගෙන ඇත්තේ බටහිර විශේෂයෙන් ම බ්‍රිතානි ආයතනවලින් ය. මොවුන්ගෙන් ඇතැමකු ඊනියා සමාජවාදීන් වුව ද ඒ සමාජවාදය ද බ්‍රිතානිය හරහා ලැබුණු පුස් කෑ සමාජවාදයක් විය. එය කිසි දිනෙක යල්පැන නොගිය සමාජවාදයක් වන්නේ සමාජවාදය කිසි දිනෙක වලංගු නොවීම නිසා ය. යමක් යල්පැනීමට නම් යම්කිසි කාලයක ඒ වලංගු වී තිබිය යුතු ය. ජාතික චින්තනය පිළිබඳ අදහස (එය සංකල්පයක් වූයේ පසුව ය. අද එය කුන් පඩිවරයාගේ සුසමාදර්ශය (පැරඩයිම්) යන සංකල්පය අභිබවා යන චින්තනය නම් ප්‍රබල සංකල්පය දක්වා වර්ධනය වී ඇත. මෙරට විශ්ව විද්‍යාලවල ඊනියා උගතුන් ද ඇතුළු බොහෝ දෙනාට සංකල්පය පිළිබඳ අදහස හෝ අදහස පිළිබඳ සංකල්පය හෝ ගැන දැනුමක් නොතිබීම කණගාටුදායක වෙයි.) ඉදිරිපත් කළ ගුණදාස අමරසේකර මහතා පවා මුල දී කතා කෙළේ මාක්ස්වාදය ජාතික චින්තනයේ එකම දේශපාලන දර්ශනය ලෙස සලකමින් ය. 1986 දෙසැම්බර් මස රත්නපුරයේ පැවත් වූ දේශනයක දී ඒ මහතා ඒ බව

© Prof. Nalin De Silva

ප්‍රකාශ කෙළේ ය. ඒ දේශනය සංවිධානය කෙළේ පරාක්‍රම කොඩිතුවක්කු මහතා ඇතුළු පිරිසක් වීමෙන් ම එකල පැවති ව්‍යාකූල තත්ත්වය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ය. වැඩිකල් නොගොස් ම මාක්ස්වාදය ඊනියා සමාජවාදයක් සම්බන්ධයෙන් නම් කිසි දා වලංගු නොවූ දහමක් බව තේරුම්ගැනීමට අපට හැකිවිය.

මාක්ස්වාදය යනු හෙගල්ගේ දර්ශනය මෙන් ම කතෝලික චින්තනය මත පදනම් වූ දැනුම් පද්ධතියක් බව අද අපි දනිමු. ඊනියා අපෝහකය කතෝලික චින්තනයේ ත්‍රිකෝටික න්‍යාය ඇසුරු කරමින් නිපදවාගන්නා ලද්දකි. හෙගල්ගේ දර්ශනය කතෝලික චින්තනය මත පදනම් වී ෆැසිස්ට් රාජ්‍ය සඳහා දර දිය ඇද්දේ නම් මාක්ස්වාදය ද කතෝලික චින්තනය මත පදනම් වී එවැනිම ඒකාධිපති රාජ්‍ය ක්‍රමයක් වූ ලෙනින් ස්ටැලින්වාදී රාජ්‍ය බිහිකෙළේ ය. කතෝලික චින්තනයට බිහිකළ හැක්කේ ඒකාධිපති රාජ්‍ය ය. බටහිරයන් මධ්‍යකාලීන යැයි කියන යුගයේ දී මෙන් ම විසිවැනි සියවසේ ද කතෝලික චින්තනය විසින් බිහිකෙරී ඇත්තේ ඒකාධිපති රාජ්‍ය ය. අද පවත්නා බටහිර ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය බිහි වී ඇත්තේ පහළොස්වැනි සියවසේ බටහිර යුරෝපයේ බිහි වී වර්ධනය වූ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය. (චින්තනය යන සංකල්ප ගැන නොදන්නා ඊනියා උගතුන්ට මෙය නොවැටහීම පිළිබඳ පුදුමයට පත්විය යුතු නො වෙයි. චින්තනය යන්න බටහිර රටක උපත ලැබූ සංකල්යක් නම් මේ ඊනියා උගතුන් ඒ ගැන විමසිලිමත්වනු නො අනුමාන ය. අද ඔවුන්ට චින්තනය යනු තවත් ඊනියා සිංහල ජාතිවාදී අදහසක් පමණ ය.)

ජනාධිපතිනියගේ ඊනියා ව්‍යවස්ථා උපදේශකයෝ වඳ අනුකාරකයෝ වෙති. ඔවුන් අතින් නිර්මාණය වී ඇති සංකල්පයක්, ප්‍රවාදයක් නැත. ඔවුන් දන්නේ බටහිර රෝම ලන්දේසි නීතිය වැනි ක්‍රිස්තියානි නීති හා බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියක බිහි වී ඇති බටහිර දේශපාලන විද්‍යා සංකල්ප හා ප්‍රවාද ය. ඔවුන් අවාසනාවකට ලංකාව දෙස බලන්නේ ද මේ ප්‍රවාද හා සංකල්ප ආශ්‍රයෙන් ය. එංගලන්තයේ ඉතිහාසය ඇරඹෙන්නේ 1055 දී සිදු වූ නෝමන් ආක්‍රමණයත් සමග ය. ඉන් පෙර එංගලන්තයට ඇත්තේ ආක්‍රමණවල ඉතිහාසයක් පමණ ය. නෝමන් ආක්‍රමණය තවත් ආක්‍රමණයක් පමණක් බවට පත් නො වී ඉංගිරිසි ජාතිය ගොඩ නැංවීමට අත්තිවාරම දැමී ය. ඉංගිරිසි ජාතිය ජාතියක් වූයේ ඉන් බොහෝ කාලයකට පසුව ය. මෙරට අනුකාරකයන්ට සංසන්දනයක් අවශ්‍ය නම් ලංකාවේ නෝමන් ආක්‍රමණයට සමාන්තර යැයි කිවහැකි දෙයක් වී ඇත්තේ ක්‍රි පූර්ව 9 වැනි සියවසේ පමණ (ශිරාන් දැරණියගල මහතාට අනුව) සිදු වූ අර්ධ වෛදිකයන්ගේ ආගමනයත් සමග ය. ඉන්පසු පණ්ඩුකාභය රජු දවස සිංහල ජාතිය ගොඩනැගිණි. ඇතැම් අනුකාරකයන්ට අනුව ලංකාවේ තවම සිංහල ජාතිය ගොඩනැගී නැත. ඒ ඉංගිරිසි ජාතිය ගොඩනැගීමට ධනපති ක්‍රමය අවශ්‍ය වූ බැවින් ය. ලංකාවේ ද ජාතිය ගොඩනැගීමට ධනපති ක්‍රමය ගොඩනැගෙන තෙක් යුරෝපයට හා උතුරු ඇමරිකාවට එහා ලෝකයක් නැති මේ වඳ අනුකාරකයෝ සිතති.

අනුකාරකයන් ඇත්තේ බටහිර දැනුම සම්බන්ධයෙන් පමණක් නො වෙයි. භාරතය අනුකරණය කරන මෙරට ඇතැම්හු මහායානිකයෝ වෙති. මහායානය යනු බුදු දහමේ අසංගත (අසංගත මිස අසංග වසුබන්ධු හා සම්බන්ධ අසංග නොවන බව අවධාරණය කළ යුත්තේ ඇතැමුන් එසේ තේරුම්ගැනීමට ඉඩ ඇති බැවිනි.) වෛදිකකරණයක් නමුදු මේ පුස්සන්ට ඒ ගැන පවා වැටහීමක් නැත. චින්තනය ගැන දැන සිටියේ නම් මහායානය වෛදික චින්තනය පදනම් කරගත් දැනුම් පද්ධතියක් බවත් ථෙරවාදය ප්‍රාග් වෛදික චින්තනයක් පදනම් කරගත් දැනුම් පද්ධතියක් බවත් වටහා ගැනීමට මේ පුස්සන්ට හැකිවනු ඇත. එහෙත් අනෙක් පුස්සන් මෙන් ම මේ පුස්සෝ ද ඒ බව නොදනිති. ඔවුන් දන්නා එකම දෙය පොත් දහයක පහළොවක ඇති දැනුම එක එකින් ටිකක් බැගින් ගෙන තවත් පොතක් ලිවීම පමණ ය. දැනුම නිර්මාණය යනු එතෙක් ලියැවුණු කිසිම පොතක නැති දැනුමක් ඇති කිරීම බව මොවුහු නොදනිති. වඳ අනුකාරකයන්ට එසේ කළ හැකි ද නොවෙයි. ඔවුන් ලියන ආකාරයේ පොත් අගය නොකිරීම ඔවුන්ට අනුව සදාචාරයක් නොමැති විචාරයකි.

කෙසේ වෙතත් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ උපදේශකයන් හා ඔවුන් වටා සිටින රාජ්‍ය නොවන සංවිධානවල සාම වෙළෙන්දන් කියන පරිදි මෙරට ඇත්තේ ජාතිය ගොඩනැගීම පිළිබඳ ප්‍රශ්නයකි. එහෙත් ඒ එසේ නොව පණ්ඩුකාභය රජු දවස සිට පැවත එන සිංහල ජාතිය ජාතියක් ලෙස නොපිළිගැනීම පිළිබඳ ප්‍රශ්නයකි. දෙමළ ජනවර්ගයේ හා මුස්ලිම් ජනවර්ගයේ ප්‍රශ්නය වී ඇත්තේ මේ ගොඩනැගී ඇති ජාතිය නොපිළිගැනීමත් එයට ඇතුල්වීමට අකමැතිවීමත් ය. පණ්ඩුකාභය රජු දවසින් පසු භාරතයෙන් මෙරටට පැමිණි විවිධ කොටස් සිංහල ජාතියට කුලවැද්දුම් කරගත්තේ ඇතැම්විට ඔවුන් සිංහල ජාතියෙහි ම විවිධ කුල බවට පත්කරගැනීමෙන් ය. දඹදෙණි හා කෝට්ටේ යුග දක්වාම ඒ

© Prof. Nalin De Silva

කුලවැද්දුම් ක්‍රමය ක්‍රියාත්මක විණි. මෙරට අද සිටින දෙමළ ජනවර්ගය මෙන් ම මුස්ලිම් ජනවර්ගය ද මෑතක දී මෙරටට පැමිණ ඇත. දෙමළ ජනවර්ගය තොග පිටින් මෙරටට ගෙන්වනු ලැබුයේ මුලින් ම ලන්දේසීන් විසිනි. මුස්ලිම් ජනයා අරාබියෙන් වෙළදාම සඳහා මෙරටට පැමිණිය ද ඔවුහු මෙරට පදිංචි නොවූහ. අරාබි ජනයා මෙරටට පැමිණ සිංහල කතුන් විවාහ කරගෙන පදිංචි වීය යන්න විශ්වාස කළ හැකි කතන්දරයක් නො වෙයි. එසේ වූවා නම් ඔවුන්ගෙන් පැවත එන්නන් කතා කළ යුතුව තිබුණේ මවගේ හා පරිසරයේ භාෂාව වූ සිංහල ය. නැතහොත් අඩුම තරමින් පියාගේ භාෂාව වූ අරාබි ය. ඒ දෙකම නැතිව ඔවුන් දෙමළ කතා කරන්නේ ඇයි? එයට හේතුව ඔවුන් පසු කලෙක දකුණු ඉන්දියාවෙන් පැමිණි දෙමළ කතාකරන මුස්ලිමුන් වීම ය. දෙමළ ජනවර්ගයට මෙන් ම මුස්ලිම් ජනවර්ගයට ද කෝට්ටේ යුගයේ හා එයට පෙර සිදු වූවාක් මෙන් සිංහල ජාතියෙහි කුල වැද්දුම් වීමට නොහැකි වී ඇත. එයට හේතුව ඔවුන් මෙරටට ආනයනය කළ අධිරාජ්‍යවාදීන් ඒ සඳහා ඉඩක් නොතැබීම ය. මෙරට ප්‍රශ්නය එය මිස ඊනියා ජාතිය ගොඩනැගීමේ ප්‍රශ්නයක් නො වෙයි. ඔවුන්ට අද සිංහල වීමට හැකියැයි මම නො කියමි. එහෙත් ඔවුන්ට ලංකාවේ විශේෂිත සංස්කෘතිය සිංහල බෞද්ධ බව පිළිගනිමින් එවන් ලංකාවක ලාංකික දෙමළ හෝ ලාංකික මුස්ලිම් වීමේ හැකියාව ඇත. එහි දී නොකළ යුතු ප්‍රධාන ම කාර්යය නම් බොරු ඉතිහාස ගොඩනැගීම ය.

සෝබෝන් හි ඉගෙන ගත්තේ යැයි කියන (එය සුදුසුකමක් නො වෙයි.)  චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට මේ කරුණු ගැන වැටහීමක් නැත. ඇගේ උපදේශකයන්ට ද එසේම ය. අද මොවුන් සුදානම් වන්නේ සන්ධානයට ඡන්දය දුන් අති මහත් ජනකායකගේ අපේක්ෂා සුන්කර රාජ්‍ය නොවන බත්බැලයන්ගේ බොරු උගත්කමින් ප්‍රයෝජන ගැනීමට ය. රාජ්‍ය නොවන බත්බැලයන්ගේ මතය ප්‍රධාන වශයෙන් ම නියෝජනය වූයේ වික්‍රමබාහු, වාසුදේව, විජේ ඩයස් ආදී මාක්ස් ට්‍රොට්ස්කිවාදීන් හරහා ය.  ඔවුන් ලබාගත් ඡන්ද හා මනාප සංඛ්‍යාව දන්නා අයෙක් වෙත් ද? කුමාරතුංග මහත්මියගේ උපදේශකයන් නියෝජනය කරන්නේ එසේ අතුගෑවී ගිය මතයකි. ජාතික හෙළ උරුමය පිටුපස පාතාල ලෝක නායකයන් හා වෙනත් විජාතික බලවේග සිටිය ද, ජනතා විමුක්ති පෙරමුණට තවමත් කසිකබල් මාක්ස්වාදයෙන් මුළුමනින් ම කැඩෙන්නට නොහැකි වුව ද, ශ්‍රී ල නි පක්ෂයේ නායකත්වය ඇත්තේ මහජන පක්ෂයේ වුව ද ඒ පක්ෂවලට මෙන් ම මහජන එක්සත් පෙරමුණට ද ලැබුණේ ඒකීය රටක් අවශ්‍ය සිංහල බෞද්ධයන්ගේ ඡන්දය. ඒ ඡන්දවලින් බලයට පැමිණි කුමාරතුංග මහත්මිය මෙවර ද තමන්ට රිසි අයුරින් දෙමව්පියන්ගේ බූදලය (ජනතා කැමැත්ත) ගසා කෑමට සිතා සිටින්නේ නම් එය සිහිනයක් ම පමණක් වනු ඇත. ඇයට එසේ කළ හැක්කේ ඒ ජා පක්ෂය සමග එකතුවීමෙන් පමණකි. අද දවසේ ඇයට ඒ ජ පක්ෂය සමග එකතුවීමට යැයි කියන්නෝ ජාතිය පාවාදෙන්නෝ වෙති.

ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු ය. එහෙත් එසේ කළ යුත්තේ ව්‍යවස්ථාව හරහා ම ය. සන්ධීය (ෆෙඩරල්) ක්‍රමයක් ඇතිකිරීම අමතක කර දමා දැන් කළ යුත්තේ කරුණු දෙකක් පමණක් ගැන අවධානය යොමු කිරීම ය. අද ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට බැරි එක් හේතුවක් වී ඇත්තේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයක් ආණ්ඩු පක්ෂයට නො තිබීම ය. සමානුපාතික ක්‍රමය එයට හරහට සිටින බවත් මහජන මතය නියම ආකාරයෙන් පාර්ලිමේන්තුවේ නියෝජනය නොවන බවත් පැහැදිලි ය. එහෙත් බොරු කියා ජනතාව රැවටිය යුතු නොවෙයි. සන්ධානයට ලැබුණේ 45% ක පමණ ඡන්දයක් මිස තුනෙන් දෙකක ඡන්දයක් නො වෙයි. එමෙන් ම ආසන 160න් 105ක් දිනුවා යන්නෙන් තුනෙන් දෙකක් ඡන්ද ලැබී ඇතැයි යන්න ද ගම්‍ය නො වෙයි. සමානුපාතික ඡන්ද ක්‍රමයේ මෙන් ම කේවල ක්‍රමයේ ද අඩුපාඩු ඇත. මෙය කිසිසේත්ම ඊනියා කොළඹ කේන්ද්‍රීය කතාවක් ද නොවෙයි. මේ පාර්ලිමේන්තු ක්‍රමය යටතේ ජනතාවට බලය ඇත්තේ පාර්ලිමේන්තුව විසුරුවා හැරි දිනයේ සිට නැවත පාර්ලිමේන්තුවක් පත්කරගන්නා තෙක් පමණ ය. ජනතාවට දිගට ම බලය අවශ්‍ය නම් පාර්ලිමේන්තුව නොකැඳවිය යුතු ය. අපට සුදුසු ක්‍රමයක් සකස් කරගැනීමට සිතීමට පටන්ගන්නා තෙක් කළ යුත්තේ සමානුපාතික ක්‍රමයේ හා කේවල ක්‍රමයේ අඩුපාඩු හැකිතාක් අවම කරගැනීමට උත්සාහ දැරීම ය. ඒ සඳහා ක්‍රමයක් සකස් කරගතහොත් එය පමණක් කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ වුව ද තුනෙන් දෙකක ඡන්දය ලබාගැනීමේ හැකියාව ඇත. අඩුම තරමින් ජනමත විචාරණයක් පවත්වා ඒ ක්‍රමය ව්‍යවස්ථාවට ඇතුල් කරගත හැකි ය.

විධායක ජනාධිපති ක්‍රමය ද අහෝසි කිරීම පමණක් අවශ්‍ය නම් ඒ සමග සලකාබැලිය හැකි ය. එහෙත් එය කළ යුත්තේ කුමාරතුංග මහත්මිය අගමැති තනතුරට පත්කරගැනීමේ පටු අරමුණින් නො වෙයි. ඇය 1994 සිට කර ඇති ප්‍රමාණය හෝ කරන්නට තැත්කළ ප්‍රමාණය හෝ ගැන කතාකිරීමෙන් වැඩක් නැත. ඉදිරි අවුරුදු දෙක තුළ ඇය දෝන

© Prof. Nalin De Silva

කතිරිනාවක් බවට පත්කරගැනීමට මේ පාර්ලිමේන්තුවට නොහැකි නම් පාර්ලිමේන්තුව කළ යුත්තේ ඇයට නම්බුකාර ව ගෙදර (ලන්ඩන්) යෑමට සැලැස්වීම ය.

© Prof. Nalin De Silva